
# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර පරීක්ෂණය - 2024

7 - ශ්‍රේණිය **ගණිතය** කාලය - පැය 2

| නම - | I – කොටස | 1 සිට 20 තෙක් ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න<br>එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් හිමිවේ |
|---|---|---|

1) දී ඇති සමපාද ත්‍රිකෝණයේ සමමිති අක්ෂ සියල්ල අඳින්න.



2) $A = \{27672$ යන සංඛ්‍යාවේ ඉලක්කම් $\}$ යන කුලකය අවයව සහිතව ලියා දක්වන්න.

3) $6 + 4 \times 3$ හි නිවැරදි අගය වනුයේ,


$i)\ 30$ $ii)\ 18$ $iii)\ 22$ $iv)\ 13$

4) 20208 යන සංඛ්‍යාවේ ඉලක්කම් දර්ශකය සොයන්න.

5) 64 ☐ යනු ඉලක්කම් 3 කින් යුත් 4න් බෙදෙන සංඛ්‍යාවකි. හිස්කොටුවට ගැලපෙන පිළිතුරු (ඉලක්කම්) 2ක් ලියන්න.

6) 18 ,12 යන සංඛ්‍යාවල ම.පො.සා සොයන්න.

7) $(+3) + (-1)$ සංඛ්‍යා රේඛාව භාවිතයෙන් සුළු කරන්න.





8) පහත වර්ෂ අතරින් අධික අවුරුද්දක් වන වර්ෂය තෝරා, එය අයත් වන සියවස ලියන්න.

1943 , 2006 , 1996

අධික අවුරුද්ද -

එය අයත් වන සියවස -

9) රූපයේ දැක්වෙන කෝණය නම් කර, එය අයත් වන කෝණ වර්ගය ලියන්න.




කෝණය -

කෝණ වර්ගය -

10) $0.7$ භාගයක් ලෙස දක්වන්න.

11) $3\frac{2}{3}-1\frac{1}{6}$ හි අගය සොයන්න.


12) $3x=27$ යන සමීකරණය විසඳන්න.

13) $A$ කාණ්ඩයට ගැලපෙන පිළිතුරු $B$ කාණ්ඩයෙන් තෝරා යා කරන්න.

| $A$ | $B$ |
|---|---|
| $125\ cm$ | $1m\ \ 25cm$ |
| $125\ cm$ | |
| $1.25\ m$ | $12\ cm\ 5\ mm$ |
| $12.5\ m$ | |

14) අවන්හලක පාන් ගෙඩියක මිල රු $p$ වේ. පාන් ගෙඩි 2ක් සහ රු 30 ක පරිප්පු දීසියක් ගත් අයෙකු ගෙවිය යුතු මුළු මුදල, වීජීය ප්‍රකාශනයකින් දක්වන්න.

15) පහත රූපය ඇසුරින් දී ඇති ප්‍රකාශය සත්‍ය නම් √ ලකුණද, අසත්‍ය නම් × ලකුණද යොදන්න.





$i)\ PQRTS$ අවතල බහු අස්‍රයකි ( )

$ii)\ PQR$ මහා කෝණික ත්‍රිකෝණයකි ( )

$iii)\ SPT$ සමපාද ත්‍රිකෝණයකි ( )

$iv)\ PQRST$ සවිධි බහුඅස්‍රයකි ( )

16) නිවැරදි පිළිතුර රූපයේ දී ඇති අක්ෂර ඇසුරින් ලියන්න.




විෂ්කම්භය -

කේන්ද්‍රය -


17) $4.246\times 100$ සුළු කරන්න.

18) ජල ටැංකියකින් මිනිත්තුවට ජලය $6l\ 250ml$ කාන්දු වේ. මිනිත්තු 10 කදී ටැංකිය සම්පූර්ණයෙන් හිස්විය. ටැංකියේ තිබූ මුළු ජල පරිමාව සොයන්න.

19) 26 හි සියලු සාධක වටා ◯ ක් අඳින්න.

1 , 6 , 2, 13 ,4 , 8 ,26

20) දිග, පළල, උස පිළිවෙලින් $10cm$ , $8\ cm$ හා $4\ cm$ වන ඝනකාභ හැඩයේ පෙට්ටියක පරිමාව සොයන්න.



# II - කොටස

- පළමුවන ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශ්නයට ලකුණු 16ක්ද, ඉතිරි ප්‍රශ්නවලට ලකුණු 11 බැගින්ද හිමිවේ.

1) $(a)$ වෘත්ත පාඩම අධ්‍යනයේදී සිදු කළ ක්‍රියාකාරකම සිහිපත් කරන්න.

i. එහිදී වෘත්ත ඇඳීමට භාවිතා කළ ජ්‍යාමිතික උපකරණය නම් කරන්න. (ලකුණු - 1)

ii. එම උපකරණය භාවිතා කර අරය $4cm$ වූ වෘත්තයක් අඳින්න. (ලකුණු - 2)

iii. වෘත්තයේ කේන්ද්‍රය $O$ ලෙසද වෘත්තය මත පිහිටි ලක්ෂ්‍යයක් $X$ ලෙසද නම් කරන්න. (ලකුණු - 2)

iv. $X$ හා $O$ ලක්ෂ්‍යය යා කර එම රේඛාව $Y$ හිදී නැවතත් වෘත්තය හමුවන සේ දික් කරන්න. (ලකුණු - 2)

$(b)$ සමාන්තර සරල රේඛා පාඩමේදී සමාන්තර රේඛා ඇඳීමට සිදුකළ ක්‍රියාකාරකම සිහිපත් කරන්න.


i. සමාන්තර සරල රේඛා ඇඳීමට භාවිතා කළ ජ්‍යාමිතික උපකරණ 2ක් නම් කරන්න. (ලකුණු - 2)

ii. ඉහත $(a)$ හිදී අඳින ලද රූප සටහනේම $XY$ රේඛාවට සමාන්තර වන සේ $2.5cm$ දුරින් ගමන් ගන්නා සමාන්තර සරල රේඛාවක් අඳින්න. (ලකුණු - 3)

iii. එය වෘත්තය කැපෙන තැන් $A$ හා $B$ ලෙස නම් කරන්න. (ලකුණු - 2)

iv. $AB$ හි දිග මැන ලියන්න. (ලකුණු - 2)

2) පහත දැක්වෙන්නේ සෘජුකෝණාස්‍රාකාර උද්‍යානයක ඉදිකර ඇති මල් පාත්තියක් හා පොකුණක දළ රූප සටහනකි. ඉතිරි කොටසේ තණකොළ වවා ඇත.




i. $ABCD$ උද්‍යානයේ පරිමිතිය සොයන්න. (ල - 3)

ii. මල් පාත්තියේ වර්ගඵලය සොයන්න. (ල - 3)

iii. පොකුණේ පරිමිතිය සොයන්න. (ල - 3)

iv. පොකුණ වටා ආරක්ෂිත වැටක් සවි කිරීමට අවශ්‍ය බව උද්‍යාන පාලක තීරණය කර ඇත. ඒ සඳහා කම්බි පොටවල් 3ක් අවශ්‍ය වේ නම් අවශ්‍ය කම්බි වල දිග සොයන්න. (ල - 2)

3) i. $4250g$, ග්‍රෑම් සහ මිලිග්‍රෑම්වලින් දක්වන්න. (ලකුණු - 1)

ii. එකතු කරන්න. (ලකුණු - 2)

| | $g$ | $mg$ |
|---|---|---|
| | 15 | 270 |
| + | 35 | 820 |

iii. පාන් පිටි $1kg\ 900g$ කින් යම් ප්‍රමාණයක් භාවිතා කර රොටී සාදන ලදී. පසුව පාන් පිටි $270g$ ක් ඉතිරි විය. රොටී සෑදීමට ගත් පිටිවල ස්කන්ධය කොපමණද ? (ලකුණු - 2)

iv. ගුණ කරන්න. $6kg\ 675g\ \times 12$ (ලකුණු - 3)

v. බෙදන්න. $18kg\ 500g\ \div 4$ (ලකුණු - 3)

4) $(a)$ i. $2xy^2$ ප්‍රසාරණය කර ලියන්න. (ලකුණු - 1)

ii. $x = 2$ හා $y = 3$ වන විට, $2xy^2$ හි අගය සොයන්න. (ලකුණු - 2)

iii. $64$ , පාදය $4$ වූ දර්ශක අංකනයෙන් ලියන්න. (ලකුණු - 2)

$(b)$ පොතක මිල පෑනක මිල මෙන් තුන් ගුණයකි. පොතක් හා පෑනක් මිලට ගැනීමට පැතුම්ට රු 60ක් වැය වේ. පෑනක් මිල රු $x$ නම්,

i. පොතක මිල $x$ ඇසුරින් දක්වන්න. (ලකුණු - 1)

ii. පොතක් හා පෑනක් මිලදී ගැනීමට වැය වන මුදල සඳහා වීජීය ප්‍රකාශනයක් ලියන්න. (ලකුණු - 2)

iii. සමීකරණයක් ගොඩනගා විසඳීමෙන්, පෑනක මිලත් පොතක මිලත් සොයන්න. (ලකුණු - 3)

5) $(a)$ i. $1\frac{3}{4}$ විෂම භාගයක් ලෙස දක්වන්න. (ලකුණු - 1)

ii. විශාල භාගය තෝරා ලියන්න. $\frac{4}{5}$ , $\frac{4}{9}$ (ලකුණු - 2)

iii. කමල් තම නිවසේ සිට $1\frac{1}{2}km$ පාපැදියෙන් ගොස්, ඉතිරි $3\frac{1}{4}km$ බසයෙන් ගමන් කර පාසලට ළඟා වෙයි. නිවසේ සිට පාසල පිහිටා ඇත්තේ කොපමණ දුරකින්ද ? (ලකුණු - 2)

$(b)$ අගය සොයන්න.

i. $3.04 \times 3$

ii. $20.52 \div 4$

iii. $0.0025 \div 100$ (ලකුණු - 2 × 3)

6) $(a)$ සුළු කරන්න.

i. $(+5) + (+3)$

ii. $(-8) + (-1)$

iii. $\left(-\frac{4}{8}\right) + \left(+\frac{3}{8}\right)$

(ලකුණු - 2 × 3)

$(b)$ $B = \{$10 ත් 50 ත් අතර ඇති සමචතුරස්‍ර සංඛ්‍යා$\}$ කුලකය නම්,

i. $B$ කුලකයේ අවයව සඟල වරහන් තුල ලියා දක්වන්න. (ලකුණු - 2)

ii. $B$ කුලකය වෙන් රූප සටහනක දක්වන්න. (ලකුණු - 3)

7) $(a)$ i. 18 හා 24 ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙස ලියන්න. (ලකුණු - 4)

ii. 18, 24 හි කු.පො.ගු සොයන්න. (ලකුණු - 2)

$(b)$ i. එකතු කරන්න.

| | මාස | දින |
|---|---|---|
| | 8 | 18 |
| + | 2 | 17 |

(ලකුණු - 2)

ii. විදේශගත අධ්‍යාපනය හැදෑරූ නිමන්ත ඒ සඳහා 2012-04-26 දින විදේශගත වී නැවත ලංකාවට පැමිණියේ 2017-02-21 වනදාය. ඔහු විදේශ ගත වී සිටි කාලය කොපමණද ?

(ලකුණු - 3)

PARCEL NO

**LOL.lk**
**BookStore**

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**